## ඉතාලියේ මුසෝලිනීගේ ක්‍රියා කලාපය

විශාල අධිරාජ්‍යයක් ගොඩ නඟා ගැනීමේ බලවත් ආශාවෙන් පසු වූ ඉතාලිය මුසෝලිනී යටතේ යුද හා නාවික ශක්තිය ගොඩ නඟා ගැනීමට කටයුතු සංවිධානය කෙළේ ය. ක්‍රි.ව. 1936 දී මුසෝලිනී, එකල ඇබිසීනියාව නමින් හඳුන්වන ලද වර්තමාන ඉතියෝපියාව ආක්‍රමණය කොට එය අත්පත් කොට ගත්තේ ය. ඉතාලියේ නැඟී ඒම දෙස සෙසු යුරෝපා රටවල අවධානය යොමු වී තිබුණ නමුත්, මුසෝලිනීගේ ආක්‍රමණශීලි ඈඳා ගැනීම්වලට එරෙහි ව කිසිවෙකු හෝ ඉදිරිපත් නො වී ය. ජාතීන්ගේ සංගමය විසින් සම්බාධක පැනවූ නමුත් එම සංවිධානයට වුව ද වෙනත් කිසිදු ප්‍රායෝගික ක්‍රියා මාර්ගයක් අනුගමනය කළ නොහැකි විය. ඉතාලිය ජාතීන්ගේ සංගමයෙන් ඉවත් වූ අතර, එය මුසොලනී හිතුවක්කාර ලෙස ආක්‍රමණකාරී ප්‍රතිපත්තියක් ඉදිරියට ගෙන යන බවට සංඥාවක් විය.

## ජපානයේ ආක්‍රමණකාරී ප්‍රතිපත්තිය

19 වන සියවසේ අග භාගයේ සිට ලෝකයේ ඉතා දියුණු තවත් රටක් වූයේ ජපානය යි. ජපානයේ ඇති වූ ආර්ථික සංවර්ධනයේ ප්‍රතිඵලයක් වශයෙන් පුළුල් වූ නිෂ්පාදන අලෙවි කිරීම සඳහා වෙළෙඳපොළ සොයා ගැනීමේ අවශ්‍යතාව මතු විය. ජපානයට අවශ්‍ය වූයේ බටහිර අධිරාජ්‍යවාදීන් මෙන් ආසියාවේ අධිරාජ්‍යයක් ගොඩ නඟා ගැනීමට යි. ඒ සඳහා යටත් විජිත ඈඳා ගැනීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කළ ජපානය ක්‍රි.ව. 1934 දී උතුරු චීනයේ මැන්චූරියාව ආක්‍රමණය කෙළේ ය. ජාතීන්ගේ සංගමය විසින් එම සිදු වීමේ වරදකරු වශයෙන් ජපානය නම් කළ හෙයින් ඇය ජාතීන්ගේ සංගමයෙන් ඉවත් විය. ඉන් පසු ව චීනයේ වැදගත් වරායන් හා නගර කිහිපයක් ද ජපානය විසින් අල්ලා ගනු ලැබී ය.

## ජාතීන්ගේ සංගමයේ අසාර්ථකත්වය

යුරෝපා බලවතුන් ඔවුනොවුන්ගේ අවශ්‍යතා අනුව ගිවිසුම් ඇති කර ගත් අතර ජර්මනිය, ඉතාලිය, ජපානය වැනි රටවල් ජාතීන්ගේ සංගමයෙන් ඉවත් වූහ. ඒ අනුව ජාතීන්ගේ සංගමය පලක් නැති තත්ත්වයකට පත් වී තිබිණි. සාමාජික රටවල් ආක්‍රමණික කටයුතුවල නිරත වීම වැළැක්වීමට අවශ්‍ය හමුදා ශක්තිය සංගමය සතු නොවීම සංගමයේ කාර්ය භාරය දුර්වල කිරීමට හේතු විය.

පළමුවන ලෝක යුද්ධයෙන් පසු ව ලෝක සාමය ආරක්ෂා කිරීම සඳහා සාමූහිකත්වය යොදා ගැනීමට පිහිටුවා ගත් ජාතීන්ගේ සංගමය ඒ කාර්යයෙහි ලා අසමත් වීම නිසා, මිත්‍ර ගිවිසුම් මගින් ජාතීන්ගේ ආරක්ෂාව සලසා ගැනීමට ක්‍රියා කිරීමේ අනිවාර්ය ප්‍රතිඵලය වූයේ බලවත් ජාතීන් දෙවන ලෝක යුද්ධයට තුඩුදෙන ආකාරයට ආයුධ සන්නද්ධ වීම යි. මෙම හේතු එකිනෙකට ගොනුවෙමින් යුද්ධයට අර අදිමින් සිටින අතර වෙඩිල්ල පත්තු වූයේ ජර්මනිය විසින් පෝලන්තය ආක්‍රමණය කරනු ලැබීමත් සමඟ ය.

එසේ යුරෝපයේ දී ආරම්භ වූ යුද්ධයට ජපානය එකතු වීමෙන් ආසියාව ද, ඇමරිකා එක්සත් ජනපදය එකතු වීමෙන් ඇමරිකා මහාද්වීපය ද සම්බන්ධ වීමෙන් එය ලෝක සංග්‍රාමයක් බවට පත් වී ය.

## පාර්ශ්වකරුවන්

දෙවන ලෝක මහා සංග්‍රාමයෙහි පාර්ශ්වකරුවෝ මිත්‍ර පක්ෂය හා අක්ෂ පක්ෂය ලෙස දෙපිළකට බෙදී සිටියහ.

- මිත්‍ර පක්ෂය - මහා බ්‍රිතාන්‍යය, ප්‍රංශය, රුසියාව, ඇමරිකා එක්සත් ජනපදය
- අක්ෂ පක්ෂය - ජර්මනිය, ඉතාලිය, ජපානය, හන්ගේරියාව, රුමේනියාව

## පාර්ශ්වකරුවන්ගේ දායකත්වය


රූපය 4.10
වින්සන්ට් චර්චිල් මහතා

හිට්ලර් විසින් ක්‍රි.ව. 1939 සැප්තැම්බර් පළමුවන දින පෝලන්තය ආක්‍රමණය කිරීමත් සමඟ දෙවන ලෝක සංග්‍රාමය සඳහා පළමු පියවර තැබුවේ ජර්මනිය යි. පෝලන්තය ආරක්ෂා කොට ගැනීමේ අරමුණ ඇති ව බ්‍රිතාන්‍යය හා ප්‍රංශය ද ජර්මනියට විරුද්ධ ව යුද්ධ ප්‍රකාශ කිරීමෙන් දෙවන ලෝක මහා සංග්‍රාමයට සහභාගි වූහ.

එම සටනින් ජර්මනිය ජය ගත් අතර රුසියාව හා ජර්මනිය අතර ඇති කොට ගෙන තිබූ සම්මුතියට අනුව මෙම දෙරට අතර පෝලන්තය බෙදාගනු ලැබී ය.

ජර්මනියේ මීළඟ ඉලක්කය වූයේ ඩෙන්මාර්කය හා නෝර්වේ ආක්‍රමණය කිරීම යි. මෙම දෙරට අල්ලා ගැනීමේ මූලික අරමුණ වූයේ, කෘෂිකාර්මික කටයුතුවලින් දියුණුව පැවති ඩෙන්මාර්කය යටත් කොට ගෙන අවශ්‍ය ආහාර ද්‍රව්‍ය ප්‍රමාණවත් පරිදි ලබා ගැනීම සහ නෝර්වේ යටත් කොට ගනිමින් එරට යපස් නිධිවල අයිතිය ලබා ගැනීම යි.

ඩෙන්මාර්කය හා නෝර්වේ යන රාජ්‍ය ජර්මනිය සතු කොට ගෙන, නෝර්වේ නැව් තොටවල් හා ගුවන් කඳවුරු, බ්‍රිතාන්‍යයට එරෙහි ආක්‍රමණවල දී භාවිත කිරීමට ද මඟ පාදා ගත්තේ ය.

ජර්මනිය ක්‍රි.ව. 1940 ජුනි මාසයේ දී ප්‍රංශයට ප්‍රහාර එල්ල කරමින් පැරිස් නගරයට ඇතුළු විය. එම ප්‍රහාරවලට මුහුණ දීමට නොහැකි වූ ප්‍රංශ රාජ්‍යය, පැරිසිය විනාශ වීම වැළැක්වීම සඳහා එම නගරය විවෘත නගරයක් බවට පත් කෙළේ ය. ඒ අනුව යුද්ධයකින් තොර ව ප්‍රංශය අත්පත් කර ගැනීමට ජර්මනිය සමත් විය. ඒ අතර ඉතාලිය ද ජර්මනියේ

සහායට ප්‍රංශයේ දකුණු දිශාවෙන් ප්‍රහාර එල්ල කෙළේ ය. ඒ අනුව අසරණ වූ ප්‍රංශය ක්‍රි.ව. 1940 ජුනි 22 දින ජර්මනිය සමඟ සාමදාන ගිවිසුමක් අත්සන් කරන ලදී. ප්‍රංශයේ යටත් විජිත හා නාවුක හමුදා අයිතිය මෙම ගිවිසුම මඟින් ජර්මනියට පවරන ලදී.

ප්‍රංශයේ පරාජය බ්‍රිතාන්‍යයට බලවත් පහරක් ලෙස සැලකූ අගමැති වින්ස්ටන් චර්චිල්, තමා ඉදිරියේ ඇති විය හැකි අන්තරායන්ට මුහුණ දීම සඳහා යුද්ධකාලීන ජාතික ආණ්ඩුවක් පිහිටුවා ගත්තේ ය.

ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපති ෆ්‍රැන්ක්ලින් ඩෙලනෝ රූස්වෙල්ට් සමඟ සම්බන්ධතා ශක්තිමත් කොට ගත් චර්චිල්, එරටින් ගුවන් හා නාවික යාත්‍රා, අවි ආයුධ, ආහාර පාන සහ ණය ආධාර ලබා ගත්තේ ය. මීට අමතර ව ඔහු බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට අයත් කැනඩාව, ඕස්ට්‍රේලියාව, නවසීලන්තය, දකුණු අප්‍රිකාව, ඉන්දියාව හා ශ්‍රී ලංකාව ආදී රටවල් ද සහභාගි කොට ගනිමින් ජර්මනියට විරුද්ධ ව පොදු යුද්ධ පෙරමුණක් ගොඩ නඟා ගත්තේ ය.

හිට්ලර්ගේ ඊළඟ ඉලක්කය වූයේ බ්‍රිතාන්‍යය යි. සබ්මැරීන් සහ අධිවේගී බෝට්ටු යොදා ගෙන, බ්‍රිතාන්‍ය නාවික හමුදාවත් භාණ්ඩ ප්‍රවාහන නෞකාත් විනාශ කොට දැමීමට හිට්ලර් සමත් විය. ක්‍රි.ව. 1940 ජුනි මාසයේ ජර්මනිය බ්‍රිතාන්‍යය වෙත ගුවන් ප්‍රහාර එල්ල කිරීම ආරම්භ කෙළේ ය. ඒ අනුව ප්‍රහාරක යානා මඟින් වරාය, ගුවන් තොටුපොළවල් සහ නගරවලට බෝම්බ හෙළන ලදී. සතුරු ගුවන් යානා විනාශ කිරීම සඳහා බ්‍රිතාන්‍යය ද ප්‍රහාරක ගුවන් යානා මෙන් ම ගොඩබිම සිට ක්‍රියා කර විය හැකි ගුවන් ප්‍රහාරක තුවක්කු ද බැලූන්වල ආධාරයෙන් අහසේ රඳවනු ලැබී ය. ක්‍රි.ව. 1940 සැප්තැම්බර් 14 දින සිදු වූ දරුණුතම සටනේ දී බ්‍රිතාන්‍යය විසින් ජර්මන් යානා 56ක් බිම හෙළා ඇත.



රූපය 4.11 බ්‍රිතාන්‍යයන් විසින් සතුරු ගුවන් යානා විනාශ කිරීම සඳහා ප්‍රහාරක ගුවන් යානා සහ ගොඩබිම සිට ක්‍රියා කරවිය හැකි ගුවන් ප්‍රහාරක තුවක්කු බැලූන්වල ආධාරයෙන් අහසේ රඳවා ගත් අයුරු මෙම රූපයෙන් දැක්වේ.

මෙම සටන්වල දී බ්‍රිතාන්‍ය පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල්වලින් බ්‍රිතාන්‍යයට මහඟු සහායක් ලැබිණි.

හංගේරියාව, රුමේනියාව සහ බල්ගේරියාව යන රටවල පක්ෂපාතිත්වය ජර්මනිය විසින් දිනා ගෙන තිබිණි. එහෙත් මාෂල් ටිටෝ යුගෝස්ලෝවියාවේ ජර්මනියට මිත්‍ර ව සිටි පාලනය පෙරළා, බ්‍රිතාන්‍යය ප්‍රධාන මිත්‍ර පක්ෂයට පක්ෂපාති රජයක් පිහිටුවා ගත්තේය.

උතුරු අප්‍රිකාවේ ප්‍රදේශ සම්බන්ධයෙන් මිත්‍ර හමුදා හා අක්ෂ පක්ෂය අතර ඇති වූ සටන්වලින් මිත්‍ර පක්ෂය ජය ගනු ලැබී ය. මේ සටන්වලින් ජර්මන් හමුදාවේ විශාල පිරිසක් සිරකරුවන් බවට පත් වී සිටියහ.

ජර්මනිය අධිරාජ්‍යයක් බවට පත් කිරීම පිළිබඳ ව ආශාවෙන් සිටි හිට්ලර්ගේ මීළඟ ඉලක්කය වූයේ රුසියාව ය. ධාන්‍ය කෙත්වතු සහ කොකේසස් සීමාවේ තෙල් නිධිවල අයිතිය ලබා ගැනීමත් කොමියුනිස්ට්වාදය තුරන් කිරීමත් රුසියාව ආක්‍රමණය කිරීමේ මූලික අරමුණ විය.

ඒ අනුව කිසිදු දැනුම් දීමකින් තොර ව ජර්මනිය විසින් රුසියාව ආක්‍රමණය කිරීම දෙවන මහා ලෝක යුද්ධයේ අතිශය තීරණාත්මක අවස්ථාවක් විය.



**රූපය 4.12**
**මිත්‍ර හමුදාව විසින් රුමේනියාවේ තෙල් බිම්වලට බෝම්බ දමා විනාශ කිරීම**

රුසියානුවෝ කෙත් වතු ගිනිබත් කර තෙල් ආකර විනාශ කළහ. එපමණක් ද නොව මැයි මාසයේ දැඩි ශීත සෘතුව එන තෙක් ජර්මානු හමුදා රුසියාව තුළ තබා ගැනීමට ද වගබලා ගත්හ. රුසියානු යුද්ධය ඉක්මනින් අවසන් වනු ඇතැයි බලාපොරොත්තු වූ හිට්ලර් ශීත සෘතුව සඳහා හමුදා සූදානම් කොට තිබුණේ නැත.


අධික ශීතල නිසා ඉතා කටුක තත්ත්වයකට මුහුණ දීමට ජර්මන් හමුදාවට සිදු විය. ජර්මානුවන්ගේ පණිවිඩ හුවමාරුව අක්‍රීය විය. ආහාර හිඟයට මුහුණ දුන් ජර්මානුවන්ගේ යුද ටැංකි ද අධික හිමපතනය නිසා ක්‍රියා විරහිත විය. ශීතල දරා ගත නොහැකි ව ජර්මන් භටයන් විශාල වශයෙන් මියයද්දී ජර්මන් හමුදා අන්ත පරාජයට පත් කිරීමට රුසියන් හමුදාවට හැකි විය. එමගින් සෝවියට් රුසියාවට බ්‍රිතාන්‍යය ඇතුළු මිත්‍රපාක්ෂිකයන් හා සම්බන්ධ වීමට ඉඩ ප්‍රස්තාව ලැබිණි. සෝවියට් රුසියාව ඉදිරියට ගමන් කරමින් සිටින විට මිත්‍ර පාක්ෂිකයෝ ප්‍රංශය මුදා ගැනීමේ වැඩපිළිවෙළක් ආරම්භ කළහ.



රූපය 4.13
**මිත්‍ර පාක්ෂිකයන් ප්‍රංශයට ගොඩබෑසීම**

මේ අතර රුසියානු හමුදා, නැගෙනහිර යුරෝපයේ නාසි පාලනය යටතේ පැවති රටවල් මුදාගනිමින්, ජර්මනිය දෙසට පැමිණියහ. ඉංග්‍රීසි, ප්‍රංශ සහ ඇමරිකානු සේනා බටහිර දෙසින් ප්‍රහාර එල්ල කළහ. ක්‍රි. ව. 1945 මාර්තු මස වන විට ජර්මනියට පැමිණි මිත්‍ර සේනා මැයි මස වන විට බර්ලින් නුවරට ළඟා විය. සිය ශක්තිය ඉතා දුර්වල බව අවබෝධ කොට ගත් හිට්ලර් ඇතුළු ඔහුගේ අණදෙන නිලධාරීහු රාශියක් ම සිය දිවි නසා ගත්හ. ක්‍රි.ව. 1945 මැයි මාසයේ දී ජර්මනිය කොන්දේසි විරහිත ව යටත් විය.

මේ අවධියේ ආසියාවේ අධිරාජ්‍යයක් ගොඩ නඟා ගැනීමට කටයුතු කරමින් සිටි ජපානයට බ්‍රිතාන්‍යය, ප්‍රංශය හා ඇමරිකාව ආදි රටවල් සමඟ ගැටෙන්නට සිදු විය. මෙම කාර්යයේ දී ජපානයට ප්‍රධාන බාධාවක් වූ හවායි දූපතේ පිහිටි පර්ල් වරායේ ඇමරිකානු නාවික කඳවුරට ක්‍රි.ව. 1941 දෙසැම්බර් 07 වන දින ජපානය බෝම්බ දැමී ය. මේ සිදු වීම මත ඇමරිකාව ජපානයට විරුද්ධ ව යුද්ධ ප්‍රකාශ කළ අතර, ජපානයේ සහායට ජර්මනිය හා ඉතාලිය ඇමරිකාවට විරුද්ධ ව යුද්ධ ප්‍රකාශ කළහ.



රූපය 4.14 පර්ල් වරායට පහර දීම

ජපානය ක්‍රි.ව. 1942 පෙබරවාරි 14 දින බ්‍රිතාන්‍යය පෙරදිග ප්‍රධාන ආරක්ෂක මධ්‍යස්ථානය වූ සිංගප්පූරුව ද යටත් කර ගත්තේ ය. අනතුරු ව හොංකොං,මලයාව, බුරුමය ආදි බ්‍රිතාන්‍ය යටත් විජිත ද සුමාත්‍රා, ජාවා, බෝර්නියෝ ආදී නැගෙනහිර ඉන්දිය දූපත් ද, පිලිපීනය සහ තවත් දූපත් රැසක් ද අල්ලා ගනු ලැබී ය.

මෙලෙස ක්‍රි.ව. 1942 වන විට ශ්‍රී ලංකාව හා ඉන්දියාව හැර මුළු දකුණු හා අග්නිදිග ආසියාව ම ජපානයට යටත් විය. ක්‍රි.ව. 1942 අප්‍රේල් 05 දා කොළඹට ද, අප්‍රේල් 07 දා ත්‍රිකුණාමලයට ද ජපානය විසින් බෝම්බ හෙළන ලදී. මේ නිසා ජපන් හමුදාව ශ්‍රී ලංකාව ආක්‍රමණය කරනු ඇතැ යි සිතූ බ්‍රිතාන්‍යය තම සේනාංක ශ්‍රී ලංකාවේ ස්ථාන ගත කෙළේ ය. ඒ අනුව ක්‍රි.ව. 1942-45 කාලයේ දී පෙරදිග බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාව යුද කඳවුරක් බවට පත් කළේ ය. ඊසාන දිග ඉන්දියාව සහ බුරුමය ආදි ප්‍රදේශවල දී ජපානය හා මිත්‍ර පාක්ෂික කණ්ඩායම් අතර දරුණු සටන් ඇති විය. ක්‍රි.ව. 1944 දී ඇමරිකානු හමුදා විසින් පිලිපීනයේ කඳවුරු පිහිටුවා ගනු ලැබී ය.

පරාජයට පත් වෙමින් සිටි ජපානයට යටත් වන ලෙස මිත්‍ර පක්ෂය විසින් කරන ලද අවසන් නිවේදනය ද ප්‍රතික්ෂේප වීම නිසා, ක්‍රි.ව.1945 අගෝස්තු 06 දා හිරෝෂිමාවට ද අගෝස්තු 09 දා නාගසාකි නගරයට ද පරමාණු බෝම්බ හෙළන ලදී. මිං ලක්ෂයකට අධික පිරිසක් මියගිය අතර ඊට වඩා වැඩි පිරිසක් තුවාල ලැබූහ. විකිරණ බලපෑම් නිසා බොහෝ පිරිසක් පරම්පරාගත රෝගීන් බවට පත් වූහ.



රූපය 4.15 පිලිපීනයේ බංකර්වල නටබුන්

මේ සාහසික විනාශය දුටු ජපානයේ හිරෝහිතෝ අධිරාජයා ජපන් යුද්ධ නිලධාරීන්ගේ උපදෙස් පවා නොතකා 1945 අගෝස්තු 14 දින කොන්දේසි විරහිත ව යටත් වීමට එකඟ විය. ක්‍රි.ව. 1945 සැප්තැම්බර් 02 දින මසුරි නැවේ දී මැක් ආතර් සෙනෙවියා ඉදිරියේ යටත් වීමේ ලියවිල්ල අත්සන් තැබී ය. එමඟින් දෙවන ලෝක මහා යුද්ධය නිමාවට පත් විය.

## දෙවන ලෝක මහා සංග්‍රාමයේ ප්‍රතිඵල

- දෙවන ලෝක මහා සංග්‍රාමය ලෝකයේ මෙතෙක් ඇති වූ බිහිසුණු ම සංග්‍රාමය විය. මියගිය සංඛ්‍යාව එක්කෝටි හැත්තෑ ලක්ෂයකට අධික වූ අතර ප්‍රංශය, ඉතාලිය, ජර්මනිය ආදි රටවල නගර විශාල සංඛ්‍යාවක් සුන්බුන් බවට පත් විය.

- ජර්මනිය නැගෙනහිර හා බටහිර යනුවෙන් දෙකඩ කෙරිණි. ජර්මනිය පරාජය කිරීමෙන් පසු එරට තුළ මිත්‍ර පාක්ෂික හමුදා නතර කිරීමට තීරණය කිරීම නිසා පසු කාලයේ දී බර්ලින් තාප්පය ඉදි කිරීමට සිදු විය. බළ කඳවුරු දෙක අතර ජර්මනිය නැගෙනහිර හා බටහිර වශයෙන් බෙදී ගියේ ය.

- මෙතෙක් ලෝකයේ බලවතුන් වශයෙන් සිටි ප්‍රංශයට හා එංගලන්තයට එම ස්ථාන අහිමි වී ඒ වෙනුවට ඇමරිකා එක්සත් ජනපදය හා සෝවියට් රුසියාව සුපිරි බලවතුන් ලෙස නැඟී සිටියහ. ඇමරිකා එක්සත් ජනපදය ප්‍රජාතන්ත්‍රවාදයේ ආරක්ෂකයකු ලෙසත් සෝවියට් රුසියාව කොමියුනිස්ට්වාදයේ සහ සමාජවාදයේ ආරක්ෂකයකු ලෙසත් නැඟී සිටියහ. එම බලවතුන් දෙදෙනා මුල් කොටගෙන ලෝකය දෙපිලකට බෙදීයාම ආරම්භ විය. (මෙම දෙපිලේ ක්‍රියාකාරීත්වය පිළිබඳ ව ඔබට මෙම කෘතියේ 5 වන පරිච්ඡේදයෙන් ඉගෙනීමට පුළුවන.)

- යුරෝපයේ විනාශයට පත් වූ පරාජිත රටවල් විශේෂයෙන් බටහිර ජර්මනිය හා ජපානය නඟා සිටුවීමට ඇමරිකා එක්සත් ජනපදය ඉදිරිපත් විය. මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වූ ආධාර වැඩපිළිවෙළ එවකට ඇමරිකානු රාජ්‍ය ලේකම් ධූරය දැරූ ජෝන් මාෂල්ගේ නමින් මාෂල් සැලැස්ම ලෙස හඳුන්වනු ලැබී ය.
- බ්‍රිතාන්‍යය හා ප්‍රංශය යටත්විජිතවලට නිදහස ලබා දුන්හ. දෙවන ලෝක සංග්‍රාමය නිසා අධිරාජ්‍යවාදී සංකල්පය බිඳ වැටිණි. මේ නිසා බ්‍රිතාන්‍යය ප්‍රංශය වැනි රටවල් සතු ව පැවති ශ්‍රී ලංකාව, ඉන්දියාව වැනි යටත් විජිත රැසකට නිදහස ලැබිණි.
- ලෝක සාමය ආරක්ෂා කොට ගැනීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටුවා ගැනීම දෙවන ලෝක මහා සංග්‍රාමයේ තවත් වැදගත් ප්‍රතිඵලයක් විය.



රූපය 4.16
බෝම්බ හෙලූ ගුවන් යානයක්



රූපය 4.17
නාගසාකි විනාශය

## ශිෂ්‍ය ක්‍රියාකාරකම්

- "යුද්ධයක් ජය ගැනීමට සංග්‍රාමීය ශක්තියට වඩා උපක්‍රමශීලී වීම වැදගත් වේ" දෙවන ලෝක යුද්ධය ඇසුරින් මේ කියමන විමසන්න.
- ලෝක යුද්ධ පිළිබඳ ව රූප සටහන් එකතු කොට පින්තූර පොතක් සකස් කරන්න.
- "ලෝක යුද්ධයේ විනාශය" මැයෙන් ලෝක යුද්ධ දෙක ඇසුරින් බිත්ති පුවත්පතකට ලිපියක් සකස් කරන්න.

## එක්සත් ජාතීන්ගේ සංවිධානය

ක්‍රි.ව. 1943 දී ටෙහෙරාන් නුවර දී බ්‍රිතාන්‍ය අගමැති වින්සන්ට් චර්චිල්, ඇමරිකා එක්සත් ජනපද ජනාධිපති ෆ්‍රැන්ක්ලින් ඩෙලනෝ රූස්වෙල්ට් සහ සෝවියට් රුසියාවේ නායක ජෝසප් ස්ටාලින් යන ලෝක බලවතුන් තිදෙනා විසින් පවත්වන ලද සාකච්ඡාවේ ප්‍රතිඵලය අනුව ලෝක සාමය පවත්වාගෙන යාම සඳහා ජගත් සංවිධානයක් පිහිටුවා ගත යුතු බවට යෝජනා ඉදිරිපත් විය. ඒ සඳහා වූ මූලික ප්‍රතිපත්ති මාලාව ක්‍රි.ව. 1945 සැන්ෆ්‍රැන්සිස්කෝ සමුළුවේ දී සකස් කරන ලදී. මෙම ප්‍රතිපත්ති රටවල් පනහක් විසින් අනුමත කිරීමෙන් පසු ව ක්‍රි.ව. 1945 ඔක්තෝබර් 24 දින එක්සත් ජාතීන්ගේ සංවිධානය උපත ලැබී ය. එහෙයින් ඔක්තෝබර් 24 එක්සත් ජාතීන්ගේ දිනය ලෙස නම් කොට ඇත.

### එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය අනුව එය පිහිටු වීමේ අරමුණු අතර,

- ජාත්‍යන්තර සාමය සහ ආරක්ෂාව පවත්වාගෙන යාම
- ජාතීන් අතර මිත්‍ර සම්බන්ධතා වර්ධනය කිරීම
- ආර්ථික, සාමාජීය, සංස්කෘතික හා මානුෂික ස්වභාවයෙන් යුත් ප්‍රශ්න විසඳීම
- මානව අයිතිවාසිකම් සහ මූලික නිදහස තහවුරු කිරීමෙහි ලා ජාත්‍යන්තර සහයෝගය සාක්ෂාත් කොට ගැනීම
- මෙම පොදු අරමුණු ඉටු කර ගැනීම සඳහා ජාතීන්ගේ මූලස්ථානයක් ලෙස ක්‍රියා කිරීම ආදිය ප්‍රධාන වේ.

### එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ව්‍යුහය

එක්සත් ජාතීන්ගේ සංවිධානය ප්‍රධාන ආයතන හයකින් සමන්විත වේ.
ඒවා නම්,

1. මහා මණ්ඩලය
2. ආරක්ෂක මණ්ඩලය
3. ආර්ථික හා සමාජීය කටයුතු පිළිබඳ මණ්ඩලය
4. භාරකාර මණ්ඩලය
5. ජාත්‍යන්තර අධිකරණය
6. මහාලේකම් කාර්යාලය යනාදිය යි.

එක්සත් ජාතීන්ගේ ප්‍රධාන කාර්යාලය නිව්යෝර්ක් නුවර පිහිටුවා ඇති අතර එහි ශාඛා ලොව පුරා ප්‍රධාන නගරවල පිහිටුවා ඇත. ඒ අතර ජිනීවාහි පිහිටි කාර්යාලය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

## මහා මණ්ඩලය

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සියලු ම රටවල් නියෝජනය කරන ප්‍රධාන ආයතනය මහා මණ්ඩලය යි. සෑම අවුරුද්දක ම සැප්තැම්බර් මාසයේ මෙම සභාවේ නිත්‍ය සැසිවාරය පැවැත්වේ. එහෙත් ආරක්ෂක මණ්ඩලයේ ඉල්ලීමක් අනුව හෝ සාමාජිකයන් වැඩිදෙනකු විසින් කරනු ලබන ඉල්ලීමක් අනුව හෝ එහි විශේෂ රැස්වීම් කැඳවීමට විධිවිධාන යොදා ඇත. මෙම මණ්ඩලය තුළ සියලු ම සාමාජිකයන් නියෝජනය වන්නේ, සමාන පදනමක් මත ය. සෑම සාමාජික රටකට ම එක් ඡන්දය බැගින් හිමි වේ. එක්සත් ජාතීන්ගේ ප්‍රතිපත්තියට අනුව, සෑම කාරණයක් පිළිබඳ ව ම සාකච්ඡා කොට නිර්දේශ ඉදිරිපත් කිරීම මහා මණ්ඩලය විසින් කරනු ලැබේ. සාමය ආරක්ෂා කිරීමත්, අධ්‍යාපනික, සංස්කෘතික, සමාජීය, ආර්ථික හා අන්තර් ජාතික ප්‍රශ්න පිළිබඳ යෝජනා ඉදිරිපත් කිරීමත් මෙම මණ්ඩලය විසින් කරනු ලබන ප්‍රධාන කාර්යය වේ. ආරක්ෂක මණ්ඩලයේ නිර්දේශ මත මහ ලේකම් පත් කිරීම, ජාත්‍යන්තර අධිකරණයේ විනිශ්චයකරුවන් පත් කිරීම සහ නව සාමාජිකයන් සංවිධානයට බඳවා ගැනීම මහා මණ්ඩලය මගින් සිදු කෙරේ.

## ආරක්ෂක මණ්ඩලය

සාමාජිකයන් 15 දෙනකුගෙන් සමන්විත ආරක්ෂක මණ්ඩලය නිත්‍ය සාමාජිකයන් පස්දෙනකුගෙන් යුක්ත වේ. එම සාමාජිකයන් පස්දෙනා වන්නේ ඇමරිකා එක්සත් ජනපදය, බ්‍රිතාන්‍යය, ප්‍රංශය, රුසියාව සහ චීනය යි. සෙසු සාමාජිකයන් දස දෙනාගේ සාමාජිකත්වය වසර දෙකකට සීමා වේ. ආරක්ෂක මණ්ඩලය විසින් ගනු ලබන තීරණ පිළිගෙන ඒ අනුව අවශ්‍ය පියවර ගැනීමට එක්සත් ජාතීන්ගේ සංගමයේ සියලු ම සාමාජිකයෝ බැඳී සිටිති.

## ආර්ථික හා සමාජයීය කටයුතු පිළිබඳ මණ්ඩලය

මෙම මණ්ඩලයේ සාමාජික සංඛ්‍යාව 54කි. සාමාජිකත්ව කාලය වසර 3කි. ඉන් පසු නව මණ්ඩලයක් තෝරා පත් කර ගැනෙයි.

අන්තර් ජාතික සහයෝගය තුළින් මානව සංහතියේ ආර්ථික හා සමාජීය වර්ධනය වැඩි දියුණු කිරීම මෙම මණ්ඩලයේ ප්‍රධාන අරමුණ යි.

මෙම මණ්ඩලය සිය කටයුතු ඉටු කිරීම සඳහා අනුබද්ධ ආයතන ගණනාවක් උපයෝගි කොට ගනියි. ජාත්‍යන්තර කම්කරු සංවිධානය, ආහාර හා කෘෂිකර්ම සංවිධානය, එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික හා සංස්කෘතික සංවිධානය, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක සෞඛ්‍ය සංවිධානය, එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල, වෙළෙඳාම හා සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මන්ත්‍රණ මණ්ඩලය, තීරු බදු හා වෙළෙඳාම පිළිබඳ පොදු සම්මුතිය, ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය පිළිබඳ අන්තර්ජාතික බැංකුව යනාදිය ඒ අතර වැදගත් වේ.

## භාරකාර මණ්ඩලය

මෙම මණ්ඩලය සතු ප්‍රධාන කාර්යය වන්නේ එක්සත් ජාතීන්ගේ අන්තර් ජාතික භාරකාර ක්‍රමය යටතට ගනු ලැබූ ප්‍රදේශ පාලනය කිරීම යි. එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටු වූ අවධියේ භාරකාර රාජ්‍ය 11ක් විය. මෙම රාජ්‍යවල පසුකාලයේ දී නිදහස් ආණ්ඩුක්‍රම පිහිටුවනු ලැබී ය. ක්‍රි.ව. 1986 දි පැසිපික් දිවයින්වල නිදහස් ආණ්ඩුක්‍රම පිහිටු වීමත් සමඟ භාරකාර රාජ්‍යය සියල්ල අවසන් විය.

## ජාත්‍යන්තර අධිකරණය

එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ විවිධ ආයතනවලට අවශ්‍ය නීති උපදෙස් ලබා දීම මෙහි ප්‍රධාන කාර්යය වේ. සාමාජික රටවලට අවශ්‍ය නම් තම රටෙහි පැන නැඟී ඇති ආරවුල් නිරාකරණය කොට ගැනීම සඳහා මෙම අධිකරණය වෙත ඉදිරිපත් කළ හැකි ය. එසේ ම සාමාජික රටවල් අතර පැන නඟින ආරවුල් සම්බන්ධ ව නීතිමය විසඳුම් ලබා ගැනීම සඳහා මෙම අධිකරණයේ පිහිට පැතිය හැකි ය.

මෙහි මූලස්ථානය නෙදර්ලන්තයේ හේග් නුවර පිහිටා ඇත. සාමාජික රටවල අධිකරණ ක්ෂේත්‍රයේ ඉහළ ම තනතුරක් දැරූවන් සහ අන්තර් ජාතික නීතිය පිළිබඳ ව විශේෂඥයන් අතුරින් විනිශ්චයකරුවෝ තෝරා ගනිති. මෙම අධිකරණය විනිශ්චයකරුවන් 15 දෙනෙකුගෙන් යුක්ත වන අතර ඔවුන්ගේ නිල කාල සීමාව වසර 09කි.

## මහ ලේකම් කාර්යාලය

එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ ප්‍රධාන පරිපාලන කාර්යාලය මහ ලේකම් කාර්යාලය යි. ආරක්ෂක මණ්ඩලයේ නිර්දේශ අනුව මහා මණ්ඩලය විසින් අවුරුදු පහක කාලයක් සඳහා තෝරා පත් කොට ගන්නා මහ ලේකම් මෙම කාර්යාලයේ ප්‍රධානියා වේ.

ජාත්‍යන්තර සාමයට හානිකර වේ යයි සිතිය හැකි ඕනෑ ම ප්‍රශ්නයක් ආරක්ෂක මණ්ඩලයට ඉදිරිපත් කර වීමට මහලේකම්ට බලය ඇත. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහා මණ්ඩලය පළමු වරට රැස් වූයේ ක්‍රි.ව.1946 ජනවාරි 10 දින ලන්ඩන් නගරයේ දී ය. එම ආරම්භක රැස්වීමට සාමාජිකයෝ 31 සහභාගි වූහ. පළමුවන ලේකම්වරයා නෝර්වේ ජාතික ට්‍රිග්වලි ය. (1946-52) ඉන්පසු ස්වීඩනයේ ඩැග් හැමර්ෂෙල්ඩ් එම තනතුර දැරුවේ ය. අනතුරු ව මහලේකම් ධූරය දැරූ බුරුම ජාතික ඌ - තාන් ප්‍රථම ආසියාතිකයා විය. ඔහුගෙන් පසු කොෆී අනන් මහලේකම් ධූරයට පත් වූ අතර වර්තමානයේ එම තනතුර දරන්නේ දකුණු කොරියානු ජාතික බෑන් කී මූන් ය.

## එක්සත් ජාතීන්ගේ සංවිධානය සාමය සඳහා ගත් ප්‍රයත්නය

- පරමාණු බලශක්ති කොමිසම පිහිටුවීමෙන් සංගමයේ වැඩ කටයුතු ආරම්භ විය. මෙයින් සිදු වූයේ පරමාණු බලශක්ති පාලනය කිරීම යි.
- එක්සත් ජාතීන්ගේ මණ්ඩලය විසඳූ ප්‍රථම අර්බුදය වූයේ ඉරානය තුළ රැඳී සිටි රතු හමුදාවන් ඉවත් කිරීම යි. තම හමුදාව ඉවත් කොට ගැනීමට රුසියාවට සිදු වූයේ, ආරක්ෂක මණ්ඩලය විසින් ඔවුන් ඉවත් කොට ගැනීමට අණ දීමෙන් පසුව යි.
- බ්‍රිතාන්‍යය හා ප්‍රංශය සතු ව පැවති සුවස් ඇළ ඊජිප්තුවේ ජනාධිපති අබ්දුල් ගමාල් නසාර් විසින් ජනසතු කළ අවස්ථාවේ ඊශ්‍රායලය විසින් ඊජිප්තුව ආක්‍රමණය කරන ලදී. අනතුරු ව එංගලන්තය හා ප්‍රංශය ද එකතුව ඊජිප්තුව ආක්‍රමණය කෙළේ ය. එක්සත් ජාතීන්ගේ සංවිධානය මේ අර්බුදය විසඳා තවත් ලෝක යුද්ධයකින් ලොව ආරක්ෂා කෙළේ ය.
- දකුණු අප්‍රිකාවේ වර්ණ භේදවාදී ප්‍රතිපත්තිය දෝෂ දර්ශනයට ලක්කොට එහි ගැටුම් ඇති නොවන ලෙස වග බලා ගත්තේ ය.
- ක්‍රි.ව. 1960-1970 අතර කාලයේ අධිරාජ්‍යවාදයට විරුද්ධ ව අප්‍රිකානු රටවල් ගෙන ගිය ව්‍යාපාරයට එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ආධාර සපයන ලදී.
- එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිත ආයතන මනුෂ්‍ය සංහතිය සඳහා උදාර සේවයක් ඉටු කොට ඇත. ආහාර හා කෘෂිකාර්මික සංවිධානය විසින් ලොව පුරා රටවල ආහාර නිෂ්පාදනය වැඩි කිරීමට පියවර ගෙන ඇත.
- ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් වසූරිය ලොවින් තුරන් කිරීමට සමත් වී ඇත.

එක්සත් ජාතීන්ගේ සංවිධානය එයට පැවරි ඇති කාර්යභාරය සපුරාලීමට ක්‍රියාත්මක වීමේ දී ගැටලු රැසකට මුහුණ දී ඇත. ඒවා නම්,

- ලෝකය බළ කඳවුරු දෙකකට බෙදීයාම (මේ පිළිබඳ විස්තර සඳහා 5 වන පරිච්ඡේදය බලන්න.)
- ආරක්ෂක මණ්ඩලයේ කිසියම් හෝ සාමාජිකයකු විසින් නිතර නිෂේධ බලය පාවිච්චි කිරීම තුළින් බොහෝ සැලසුම් ක්‍රියාත්මක කිරීමට බාධා පැමිණි වීම ආදිය ප්‍රධාන වේ.

### ශිෂ්‍ය ක්‍රියාකාරකම්

- ලෝක සාමය ආරක්ෂා කිරීමට පිහිටුවා ගත් එක්සත් ජාතීන්ගේ සංගමය කොතෙක් දුරට එම ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට දායක වී ඇද්දැයි විස්තර කරන්න.
- එක්සත් ජාතීන්ගේ සංවිධානය ලෝක සාමය ආරක්ෂා කිරීමට සමත් වී ඇත/නැත. මැයෙන් පංතියේ විවාදයක් පවත්වන්න.

## සාරාංශය

එකිනෙකා පරයා නැඟී සිටිමට උත්සාහ ගැනීම තුළින් මතු වූ සැකය, වෛරය ආදිය නිසා ලෝක යුද්ධයක් දක්වා රටවල් ඇදී යාම 20 වන සියවස තුළ දක්නට ලැබුණු විශේෂ සිදු වීමකි.

- එවැනි ලෝක යුද්ධ දෙකක් සිදු වීම
- පැසිස්ට් හා නාසිවාදය බිහි වීම
- මෙම යුද්ධ දෙකෙන් ලෝකයට දැරිය නොහැකි හානි රැසක් සිදු විය. ලෝක සාමය ආරක්ෂා කිරීමට ජාත්‍යන්තර සංවිධාන දෙකක් බිහි වූ අතර එයින් එකක් වූ ජාතීන්ගේ සංගමය අපේක්ෂිත අරමුණු ඉටු කිරීමට නොහැකි වීම නිසා අසාර්ථක වීම
- එක්සත් ජාතීන්ගේ සංවිධානය (United Nations Organisation) ලෝක සාමය ආරක්ෂා කිරීමට සතුටුදායක දායකත්වයක් ලබා දීම
- ලෝකය බළ කඳවුරු දෙකකට බෙදී යාම හා එමඟින් බිහි වූ මත ගැටුම් බළ කඳවුරු දෙක අතර පවත්නා සීතල යුද්ධයක් බවට පත් වීම